වලල්ලාවිට ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 විගණන වාර්ථාවේ 2.2.1.(ඉ) නිවැරදි කිරීමේදී මුද්දර ගාස්තු ගිණුම රු.50,000 ක් හර කර සමුච්චිත අරමුදල් ගිණුම රු.50,000 ක් බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එම මුදල ප්‍රාග්ධන වැය ණයහිමි ගිණුම හර කිරීම හේතුවෙන් එම ගිණුම රු.50,000 ක් අඩුවෙන් හා ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම රු.50,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට ලැබිය යුතු ජල පරිභෝජන ගාස්තු රු.1,154,791 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් පොලී වශයෙන් ලැබී තිබූ රු.59,888 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාල රු.116,962 ක් වූ විවිධ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ විදුලි භාණ්ඩ වියදම රු.79,538 ක් වැඩියෙන් දැක්වීම නිසා සමුච්චිත අරමුදල හා විදුලි භාණ්ඩ තොග රු.79,538 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

1:3:2 **නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.47,672,975 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,657,378 ක වෙනසක් නිරීක්ෂණය විය.

1:3:3 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

යාවත්කාලීන කරන ලද තැන්පත් ලේඛනය හා උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.7,426,016 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන **ප්‍රාදේශීය සභා පනතේ** 134(1) වගන්තිය | ---- | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්චල දේපලක හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව අය කළ යුතු වුවත් සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 49,491,312 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 571 | 2,066,743 | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1647 (ආ) | ------ | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | --- | සභාවේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. |
| (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | --- | පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනගත කිරීම් කර නොතිබුණි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2:1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,441,905 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,907,987 ක් විය.

2.2 මූල්‍ය පාලනය

ගිණුම් අංක 261-1-001-9-0000044 ට අදාලව දීර්ඝ කාලයක සිට පැවත එන රු.85,950 ක්වූ ගිණුම් ශේෂ 08 ක් නිරවුල් කිරිමට පියවර ගෙන නොතිබුණි.

2:3 **ආදායම් පරිපාලනය**

2:3:1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 2,760,628 | 3,056,598 | 2,980,112 | 1,965,705 | 2,727,030 | 2,977,691 | 3,169,413 | 2,216,113 |
| (ii) කුලි | 6,828,650 | 5,820,253 | 5,518,622 | 29,174 | 5,867,000 | 4,233,901 | 4,238,075 | 12,942 |
| (iii)බලපත්‍ර ගාස්තු | 143,000 | 245,990 | 247,240 | - | 70,000 | 72,360 | 70,110 | 2.250 |
| (iv)වෙනත්ආදායම් | 49,110,100 | 42,694,265 | 42,694,265 | - | 45,955,800 | 51,431,315 | 51,431,316 | - |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.2,303,176 ක් වූ අතර වර්ෂය තුල බිල් කිරීම් රු.8,645,851 ක් හා වර්ෂය තුල ලැබීම් රු.8,890,511 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් හිඟය රු.2,058,516 ක් විය.

2.3.3 **වරිපනම් හා බදු**

(අ) **වරිපනම්**

(i) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම් රු.1,982,120 ක් වූ අතර ඉන් රු.1,465,584ක් හෙවත් සියයට 74 ක් අයකරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.1,647,155 න් රු.656,972 ක් හෙවත් සියයට 40 ක් පමණක් අයකර ගෙන තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.1,506,719 ක් විය.ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අය කිරීම් ප්‍රගතිය සියයට 58 ක් විය.

(ආ) අක්කර බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු ශේෂය රු.67,523 ක් වූ අතර ඉන් 2017 දෙසැම්බර් 31 වන විට රු.16,533 ක් පමණක් අයකර ගෙන තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ බිල් කිරීම රු.14,818 ක් වූ අතර ඉන් රු.7,461 ක් එනම් සියයට 50 ක් පමණක් අයකර ගෙන තිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

(අ) **කර්මාන්ත බදු**

(i) අදාල වර්ෂය තුලදී කර්මාන්ත බදු නොගෙවූ බදුකරුවන්ට විරුද්ධව නඩු පවරා එම බදු මුදල් එකතු කලයුතු වුවත් , 2016 වර්ෂය තුලදී අය නොකල කර්මාන්ත බදු ආදායම රු.91,660 ක් වූ අතර, එම හිඟ බදුවලින් 2017 වර්ෂය තුලදී එකතු කර තිබුණේ රු.38,000 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත බදු බිල් කිරීම් රු.117,000 ක් වූ අතර,වර්ෂය තුල අයකර ගෙන තිබුණේ රු.95,750 ක් පමණි.

(iii) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත බදුකරුවන් 65 දෙනෙකුගෙන් රු.74,910 ක් හිඟව පැවති අතර එම හිඟ ශේෂය අයකිරීමට නඩු පැවරුමක් සිදු කර නොතිබුණි.

(ආ) <u>ව්‍යාපාර බදු</u>

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.425,010 ක් වූ අතර 2017 වර්ෂය තුල ඉන් රු. 230,190 ක් පමණක් අයකර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.649,660 ක් වූ අතර ඉන් රු.511,750 ක් පමණක් වර්ෂය තුල අයකර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල බදුකරුවන් 253 දෙනෙකුගෙන් රු.332,730 ක් හිඟව පැවති අතර මෙම බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 <u>වෙනත් ආදායම්</u>

(අ) <u>තොටුපල ආදායම</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟය රු.10,000 ක් වූ අතර, වර්ෂය අවසානයට එම හිඟය රු.29,174 දක්වා වැඩි වී තිබුණි.

(ආ) <u>මස් වෙළඳසැල් ආදායම</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට මස් වෙළඳසැල් හිඟ ආදායම රු.56,636ක් වූ අතර වර්ෂය තුලදී ඉන් කිසිදු මුදලක් අය කර නොතිබුණි.

(ඇ) <u>**දැන්වීම් පුවරු ආදායම්**</u>

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේදී සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ පමණක් ප්‍රදර්ශනය කළ යුතු වුවත් එසේ බලය ලබා නොගෙන දැන්වීම් පුවරු ප්‍රදර්ශණය කර තිබුණි. එසේ ප්‍රදර්ශනය කර තිබු දැන්වීම් පුවරු හා නාම පුවරු වලින් රු.239,050 ක් අය කර ගෙන නොතිබුණි.

(ඇ) <u>ජල ගාස්තු</u>

සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘතියෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.207,844 ක හිඟයක් පැවතුණි.

2.3.6 <u>**උසාවි දඩ හා මුද්දර ගාස්තු**</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.8,181,821 ක් හා මුද්දර ගාස්තු රු.4,500,000 ක් විය.

3. <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරනය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

සභාව විසින් 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්මාන්ත පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) <u>**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**</u>

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.1,021,447 ක වියදමක් දරා තිබූ අතර ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි.තවද, කසළ බැහැර කිරීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ ගිවිසුම් ගත වී නොතිබූ අතර කසළ කළමනාකරණය වෙනුවෙන් වැය වන පිරිවැය ආවරණය කරගැනීම සඳහා කසළ බදු පනවීමද සිදුකර නොතිබුණි.

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජුනි 11 දින වන විටත් සකස් කර නොතිබුණි.

3:2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) <u>රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම</u>

2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/2011 දරන චක්‍ර ලේඛයේ 4.1 වගන්තියට අනුව අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත එවීමට කටයුතු කල යුතු වුවත් එසේ නොකර සේවක අර්ථසාධක අරමුදලට මුදල් ප්‍රේෂණය කිරීම හේතුවෙන් රු.43,100 ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) <u>සභාව සතු ඉඩම් සමීක්ෂණය නොකිරීම</u>

1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 218 ප්‍රකාර සමීක්ෂණ මණ්ඩලයක් පත් කරමින් හෝ වෙනයම් ආකාරයට සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනා ගැනීමට , හඳුනාගත් ඉඩම් තක්සේරු කිරීමට හෝ අයිතිය තහවුරු වන ලෙස වැට මායිම් සකස් කර සභාවේ හිමිකම දැක්වෙන නාම පුවරු සවි කිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

3:3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

තෘතීයික මට්ටමේ තනතුරු 01 හා ද්විතීයික මට්ටමේ තනතුරු 12 ක පුරප්පාඩු පැවති අතර ද්විතීයික මට්ටමේ තනතුරු 03 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක අතිරික්තයන් විය.

(ආ) <u>සේවක ණය</u>

රැකියාවෙන් ඉවත් වූ හා විශ්‍රාම ගිය සේවකයින් තිදෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.8,750 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4:1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා වු අයවැය ලේඛනයේ අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 11 සිට 41 දක්වාත් වියදම් සියයට 12 සිට සියයට 317 දක්වාත් වු පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරික්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | | <u>අඩුපාඩුව</u> |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| (ආ) ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය නොකිරීම |
| | ii. | දැන්වීම් පුවරු හා බලපත්‍ර ගාස්තු ආදී ආදායම් නිවැරදිව හඳුනාගැනීමට අදාල විධිමත් සමීක්ෂණ නොපැවැත්වීම |
| (ඇ) අයවැය පාලනය | i. | අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම |
| | ii. | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |
| (ඇ) වත්කම්/ දේපල | i. | ලේඛනගත නොකිරීම |
| | ii. | ආරක්ෂාව තහවුරු නොකිරීම |
| (ඉ) ගබඩා පාලනය | i. | ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබීම |
| | ii. | වාහන වලින් ගලවා ඉවත් කරන ලද කොටස් සම්බන්ධයෙන් ලේඛන නඩත්තු නොකිරීම |
| (ඊ) සේවක කළමනාකරණය | | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |